# නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය මතයක් නො වූ මතයකි

ද්‍රව්‍යය සහ සිත (මනස, විඥානය ආදී වශයෙන්) පිළිබඳව දාර්ශනික ලෝකයේ බොහෝ ඈතක සිට සාකච්ඡා වේ. මෙහි දී "ද්‍රව්‍යය" යනුවෙන් අදහස් කෙරෙන්නේ සිතෙන් පරිබාහිර යන අරුතෙනි. මෙම දාර්ශනික කතිකාවතේ ප්‍රධාන පාර්ශ්ව දෙකක් දැකගත හැකි ය. එක් පාර්ශ්වයකට අනුව සිත සියල්ලන්ට ම මුල වේ. සියල්ල (එනම් ද්‍රව්‍යය ද ඇතුළුව) සිතින් නිර්මාණය කෙරී ඇත. අනෙක් පාර්ශ්වයට අනුව ද්‍රව්‍යය මූලික වේ.

සිතින් කෙරෙන්නේ එම ද්‍රව්‍ය ලෝකය ග්‍රහණය කර ගැනුම පමණි. සිත තිබුණ ද, නැත ද ද්‍රව්‍ය ලෝකය එලෙස ම පවතී. අප සාමාන්‍යයෙන් එදිනෙදා භාවිත කරන තර්ක උපයෝගී කරගෙන සාමාන්‍ය මනස් (සිත්) සහිත පුද්ගලයන් අතරේ ඉහත කී පළමු පාර්ශ්වයේ අදහස එනම්, අවට ලෝකය සිතින් නිර්මාණය කෙරී ඇත යන්න නිෂ්ප්‍රභ කෙරුම එතරම් පහසු නැත. තමා දකින්නේ (අත්විඳින්නේ) තම මනසින් (සිතින්) නිර්මාණය කරගත් (මවාගත්) ද්‍රව්‍ය ලෝකය යැයි කෙනකු කිව හොත් එය එසේ නො වේ යැයි අප ගේ සාමාන්‍ය තර්ක ඔස්සේ එනම් ධ්‍යාන ආදී කිසිවක් නො ලද මනස්වල අත්දැකීම් ඔස්සේ) සනාථ කරන්නේ කෙසේ ද? එහෙත් අනෙක් පාර්ශ්වයේ අදහස එනම් තමා අත්විඳින්නේ තම මනසින් (සිතින්) පරිබාහිර වූ, මනස ඇතත් නැතත් පවතින්නා වූ ලෝකයක් ය. (ද්‍රව්‍යයන් ය) යන්න නිෂ්ප්‍රභ කෙරුම එතරම් අපහසු නැත. මෙය එතරම් අපහසු කරුණක් නො වුව ද දාර්ශනික ලෝකයේ මෙම පාර්ශ්වයේ මතය අතිශය තීරණාත්මකව, සංගතව මෑතක දී බිඳ හෙළන ලදි. ඒ මහාචාර්ය නලින් ද සිල්වා විසිනි. මනසින් පරිබාහිර ලෝකය (යථාර්ථය) මනසින් පරිබාහිරව පෙන්වා දෙන ලෙස කෙරෙන අභියෝගය සමඟ ඊනියා ද්‍රව්‍යවාදීහු (භෞතිකවාදීහු) නිරුත්තර වූ හ. ජීවත් ව සිටින කිසිවකුට මනසින් (සිතින්) වෙන් වී කළ හැකි දෙයක් නැත. ඔවුනට මනසින් පරිබාහිර යථාර්ථයක්, ලෝකයක් ඇතැයි කිව හැක්කේ ද මනස ඇසුරෙන් ම ය. මේ අනුව, මෙම අභියෝගයත් සමඟ ද්‍රව්‍යවාදීන් ගේ (භෞතිකවාදීන් ගේ) අවසානය සනිටුහන් වේ.

බුදු දහමට අනුව දාර්ශනිකව ගත් කල සිත සහ ද්‍රව්‍යය යන දෙකෙන් එකකත් වත් ප්‍රධාන නැත. මින් අදහස් කෙරෙන්නේ අප යම් "වස්තුවක්" දැකීමේ දී මනසින් පරිබාහිර වූ වස්තුවක් මනසින් (ඉන්ද්‍රිය පද්ධතිය ද සමඟ) දැකීමක් නො වන්නාක් මෙන් ම දකින වස්තුව හුදු මනසේ නිර්මාණයක් ද නො වේ ය යන්න ය. එහෙත් බුදු දහමේ පරම නිෂ්ඨාව වන නිවන හා සබැඳි මාර්ගය පිළිබඳව සැලකීමේ දී සිත අනිවාර්යයෙන් ප්‍රධාන වෙයි. සිහිය වඩා සිත දියුණු කොට ලෝභ ද්වේෂ මෝහවලින් මුළුමනින් ම මිදීමක් එහි දී කියවේ. එනම්, කෙලෙස්වලින් මිදීම ය.

අප ගේ එදිනෙදා (ලෞකික) වැඩ කටයුතු උදෙසා සාමාන්‍ය මනස් (ධ්‍යාන ආදී කිසිවක් නො ලද) සහිත පුද්ගලයන් අතරේ සිත සහ ද්‍රව්‍ය පිළිබඳ ගැටලුව තේරුම් බේරුම් කරගත හැකි මඟක් බුදු දහම ඇසුරෙන් එහි පරම නිෂ්ඨාව වන නිවන සඳහා වන මාර්ගයට කිසිසේත් පටහැනි නො වන ලෙස ගොඩනගාගත හැකි අයුරු අපි මෙතැන් සිට බලමු. මෙවැනි මගක් නිර්වාණාවබෝධයට සෘජුව ම අදාළ නො වුව ද, අද බටහිරින් පැමිණෙන්නා වූ විවිධාකාර විද්‍යාත්මක මතවාද, දාර්ශනික සංකල්ප ආදිය අපට අවශ්‍ය පරිදි අපේ පදනමක සිට විග්‍රහ කර ගැනීම උදෙසා මහෝපකාරී වෙයි. එනම්, බටහිර මතවාද (උදාහරණයක් ලෙස ක්වොන්ටම් භෞතිකයේ අදහස්) පිළිබඳව අප ගේ මතය, අදහස කවරක් ද යන්න නිර්ණය කිරීමට මෙවැනි දෑ වැදගත් ය. බටහිර (හෝ වෙනත්) මතවාද, විද්‍යාත්මක ප්‍රවාද පිළිබඳව අපට නැසූ කන්ව සිටිය නොහැකි ය. එසේ සිටිය හොත්, අප ඒවා හමුවේ යටපත් ව යනු ඇත. බුදු දහම පවා දාර්ශනිකව යටපත් වනු ඇත. අප ඒවාට නොබියව අප ගේ පදනමක සිට මුහුණ දිය යුතු ය. ගෝලීයකරණයේ ප්‍රධාන සංරචක වන දැනුම සහ මතවාද ගෝලීයකරණයට අපට සාර්ථකව මුහුණ දිය හැක්කේ එසේ වුව හොත් ය. ගෝලීයකරණය නිසා අප මිහිපිටින් අතුගෑවී යාම වළක්වාගත හැක්කේ එලෙස ය.

අපේ සාමාන්‍ය මනස් මඟින් අප තේරුම් ගන්නා ද්‍රව්‍ය-මනස යන ද්වන්ධයේ එක් කොටසකට ඌනනය වීමෙන් මෙන් ම, මෙම කොටස් දෙකෙහි යම් යම් අනුපාතවලින් යුතු මිශ්‍රණවලට ඌනනය වීමෙන් ද මිදී ඒවා සාමාන්‍ය මනස් මඟින් අප තේරුම් ගන්නා ආකාරයට ම තේරුම් ගනිමින්, එසේ ම ඒවාට (විශේෂයෙන් ද්‍රව්‍ය යන්නට) මනසින් පරිබාහිර යථාර්ථවාදී ස්වරූපයක් ලබා නො දෙමින්, අපේ මේ සංසාර ගමනේ එක් නවාතැන්පළක් වන මිනිස් ජීවිතයට අදාළ කටයුතු කරගෙන යාමට අදාළ දාර්ශනික දොරගුලු මෑත යුගයේ දී විවෘත කර දුන්නේ නලින් ද සිල්වා මහතා ය.

බටහිර දැනුමේ විශේෂයෙන් "විද්‍යාත්මක" දැනුමේ ඇතැයි පවසන ඊනියා වාස්තවිකත්වය (කාටත් පොදු විශ්ව සාධාරණබව) යන්න මගින් අප සමාජය වෙළා පවතින මේ යුගයේ, මේ දාර්ශනික ප්‍රවේශය අතිශය වැදගත් ය. බටහිර දැනුම් ආධිපත්‍යයෙන් මිදීමට මෙමගින් අපට අවකාශ සැලසේ. අප පීඩනයට පත් වන බටහිර ආධිපත්‍යයන් අතුරෙන් අතිශය වැදගත්, තීරණාත්මක සංරචකය වන්නේ දැනුම් ආධිපත්‍යයයි. ද්‍රව්‍ය-මනස පිළිබඳ ඉහත සඳහන් දාර්ශනික ප්‍රවේශය සමග ජාතික චින්තනයක් ඔස්සේ අපට අපේ දැනුම් නිර්මාණය කිරීමට දැන් හැකි ය. මෙම දාර්ශනික ප්‍රවේශය (මෙය සැබැවින් ම මනෝ විකාරවලින් තොර අතිශය "සරල" ප්‍රවේශයකි.) නලින් ද සිල්වා මහතා ඉදිරිපත් කරන නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ලෙස හඳුනාගත හැකි ය.

ඇරිස්ටෝටල් ගේ ද්විකෝටිකයෙන් අවශ්‍ය වූ විට මිදෙමින් එසේම සීමාන්තික ඌනිතවාදවලින් මිදෙමින් දැන් අපට කටයුතු කළ හැකි ය. එසේ ම අද වන විට බටහිර දැනුම ආධිපත්‍යය තුළ ගිලී යන බුදු දහම ඉන් ගලවාගෙන, ඒ ඔස්සේ සසරින් මිදීම සඳහා කටයුතු කර ගැනීමට ද මෙම ප්‍රවේශය මගින් පදනම වැටේ. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ සුවිශාල වැදගත්කම වන්නේ බටහිර දැනුම් ආධිපත්‍යයෙන් ඔද්දල් වූ අපේ ජාතික මනස පිරිපහදු කිරීමෙහි ලා එමගින් ඉටු වන සේවය ය. බෞද්ධ මූලධර්ම මත ගොඩනැගුණු සමාජ ආර්ථික සංවර්ධන රාමුවක් මෙරටේ නැවත බිහි කිරීම වළක්වා ලන ප්‍රධාන සාධකය වන්නේ දැනට පවත්නා බටහිර දැනුම් ආධිපත්‍යයයි. හුදෙකලාව බෞද්ධ ප්‍රතිපත්තීන් අනුගමනය කරන එසේ ම බෞද්ධ බණ භාවනාවල යෙදෙන පුද්ගලයන් සමූහයක් යනු බෞද්ධ සමාජයක් හෝ බෞද්ධ රටක් (ජාතියක්) හෝ නො වේ.

බටහිර දැනුම් (විශේෂයෙන් විද්‍යාත්මක දැනුම්) මගින් තම ඔළු කුරුවල් කරගත් උදවියට නැවත තම සිත් සතන් පිරිසිදු කරගෙන ශ්‍රද්ධාවෙන් යුතුව තෙරුවන් සරණ ගොස් දිව්‍යලෝක, බ්‍රහ්ම ලෝක, අපායන් විශ්වාස කරන, පිං පව් අදහන සැබෑ බෞද්ධයන් වීමේ මහඟු අවස්ථාව නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය ඔස්සේ එළි පෙහෙළි වේ ය යනු අප ගේ විශ්වාසයයි. මෙම හෙළිදරව්ව නලින් ද සිල්වා මහතා මේ භවයේ දී සිදු කරගත් මහඟුතම පිංකම වේ.

තව ලෙසකින් සලකන්නේ නම්, නිර්මාණාත්මක සාපේක්ෂතාවාදය යනු ද්‍රව්‍යය, මනස, යථාර්ථය ආදී ලෙස අපේ මනස් තුළට කාවද්දනු ලැබ ඇති විකාරයන් ගෙන් මිදීම ය. මේ මිදීම ඔස්සේ බටහිර විවිධ දැනුම් අභියෝගයට ලක් කළ හැකිවා පමණක් නො ව බුදු දහමේ ඉගැන්වෙන පරම මිදීම වන සසරින් මිදීමට ද පදනම දමාගත හැකි ය. සියලු ම දැනුම යනු මනස් සහභාගී වූ දැ ය. මනස යන්න ප්‍රශ්න කරන විට මේ සියලු දැනුම් අභියෝගයට ලක් වේ. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ දැක්වෙන පරිදි ද්‍රව්‍ය-මනස යනු ඊනියා වාස්තවික යථාර්ථය ය යන්නෙන් මිදුණු විට බුදු දහම කෙතෙක් සුන්දර ද, සංගත ද යන්න සැකෙවින් විමසමු.

මධුපිණ්ඩික සූත්‍රය මගින් බුදුන් වහන්සේ මෙසේ දේශනා කර ඇත. "චක්ඛුඤ්චාවුසො පටිච්චෙ රූපෙච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණ තිණ්ණං සංගති ඵස්සො-ඵස්ස පච්චයා වේදනා යං වෙදෙති තං සංජානාති යං සඤ්ජානාති තං විතක්කෙති තං පපඤ්චේති". මේ අනුව රූපයක් ඇස ගැටුණු විට චක්ඛු විඤ්ඤාණයක් පහළ වන බවත් ඇසේ, රූපයේ සහ චක්ඛු විඤ්ඤාණයේ එකතුවෙන් ස්පර්ශය සහ වේදනාව ඇති වන බවත් කියවේ. එසේ ම වේදනාව නිසා සංජානනය කෙරෙන බවත් සංජානනය නිසා විතර්ක කරන බවත් අනතුරුව ප්‍රපංචකරණය සිදු වන බවත් සඳහන් ය. මේ අනුව රූපය පිළිබඳව වේදනාව ඇති වන්නේ ම විඤ්ඤාණයක් ද සහිතව ය. වේදනාව විඤ්ඤාණයෙන් පරිබාහිර නො වේ. මෙහි දී සිදු වන දේ රූපය පිළිබඳ වේදනාව විඤ්ඤාණය මගින් තේරුම් ගැනීමක් (ග්‍රහණය කර ගැනුමක්) වැන්නක් නො වේ. වේදනාවට විඤ්ඤාණය සක්‍රීයව දායක වේ. අභිධර්මයට අනුව, මෙම චක්ඛු විඤ්ඤාණය අප ගේ ප්‍රකෘති සිත වන භවංගය හා සබැඳි ය. මෙම චක්ඛු විඤ්ඤාණය භංවගය හා බැඳී ඇසේ උපදී. මේ අනුව වස්තුව දැකීමේ දී ඇති වන වේදනාවට අප ගේ ප්‍රකෘතිය වන (භවංගය) සෘජුව ම සැබැඳි ය. මධුපිණ්ඩික පාඨය අනුව, සංජානනයක් සමග එකී ක්‍රියාවලියට කර්තෘත්වයක් ආරෝපණය වේ. අභිධර්මයේ මෙම ක්‍රියාවලිය විස්තර කෙරෙන්නේ, පළමුව රූපයක් ඇස ගැටුණ විට අප ගේ ප්‍රකෘති සිත වන භවංගය චලනය වී භවංග උප්පච්ඡේද අවස්ථාව ඇති වී පංචද්වාරාජ්ජන අවස්ථාව හරහා චක්ඛු විඤ්ඤාණය පහළ වන ලෙස ය. අනතුරුව පිළිවෙළින් සම්පටිච්ඡන, සන්තීරණ, වොත්තප්පණ, ජවන සිත් හත හා තදාරම්මන සිත් දෙක පහළ වන බව ය. මේ අනුව, රූපය පිළිබඳව පළමු වේදනාවට ම භවාංගය සබැඳි ය. මෙහි දී පහළ වන චක්ඛු විඤ්ඤාණය විපාක සිත් වර්ගයට අයත් ය. අනතුරුව ජවන සිත් ඇති වන අවස්ථාවල දී, එනම් කර්ම සිත් ඇති වන විට, අප මෙම දැකීම නැමැති

ක්‍රියාවලියට "සවිඤ්ඤාණිකව" එනම් සිහියෙන් යුතු ව සම්බන්ධ වෙමු. මේ අනුව, මෙම දැකීම නමැති ක්‍රියාවලියට අප ගේ සිත මූලික ම අවස්ථාවේ දී විපාක සිතක් ලෙස එක්තරා ආකාරයක යාන්ත්‍රිකභාවයකිනුත් අනතුරුව කර්ම සිතක් ලෙස සක්‍රිය වත් සහභාගී වෙයි. පළමු කොටස "සිතෙන" කොටස ලෙසත් දෙවන කොටස "සිතන" කොටස ලෙසක් දැක්විය හැකි ය. මධුපිණ්ඩික සූත්‍ර පාඨයේ මෙන් ම අභිධර්මයේ චිත්ත වීථි (රූපයක් දැකීමට අදාළ ව)වල ද සාරය එය යැයි සිතමි. මේ අනුව, රූපයක් දැකීම නැමැති ක්‍රියාවලියට මුල සිට අග දක්වා ම සිත සහභාගී වේ. එසේ නම්, සිතෙන් තොර දැකීමක් කොහි ද? අප සාකච්ඡාව ආරම්භයේ දී "රූපයක්" ඇස ගැටුණ විට" ආදී ලෙස සඳහන් කළ ද සිතෙන් පරිබාහිර එවැනි රූපයක් නොමැති බැව් දැන් පැහැදිලි විය යුතු ය.

සබ්බ සූත්‍රයේ දී බුදුන් වහන්සේ දේශනා කරන්නේ ඇසට, කණට, නාසයට, දිවට, කයට සහ මනසට දැනෙන එනම්, ෂඩ් ඉන්ද්‍රියයනට දැනෙන ලෝකය "සබ්බය" එනම් සියල්ල බව ය. මෙම ෂඩ් ඉන්ද්‍රියයන් එනම් ද්වාර සයෙන් පරිබාහිර ව අපට කිසිවක් ග්‍රහණය කරගත නොහැකි ය. මධුපිණ්ඩික සූත්‍ර පාඨයට අනුව පළමු ද්වාර පහ (පංචේන්ද්‍රිය) ආශ්‍රිත ග්‍රහණය කර ගැනුම් සඳහා මනස සැබැඳි ය. එනම්, ඉන්ද්‍රිය සයට ම මනස සබැඳි ය. එනම්, ෂඩ් ඉන්ද්‍රියයන් ගෙන් අප ලබන සියල්ලට ම මනස සබැඳි ය. එසේ නම් මනසින් පරිබාහිර කිසිවක් නොමැත. "සබ්බය"ට ම මනස සබැඳි ය. අභිධර්මයේ දී මෙම කාරණාව පැහැදිලිව දැකිය හැකි ය.

මධුපිණ්ඩික සූත්‍ර පාඨයේ දී මෙන් ම අභිධර්මයේ චිත්ත වීථි මගින් ද කියැවෙන්නේ, දකින රූපයක් මනසින් විග්‍රහ කෙරුමක් නො වන බව නැවත අවධාරණය කළ යුතු ය. අප රූපයක් දැකීම එය හඳුනා ගැනීමෙන් වෙන් කළ නොහැකි ය. මධුපිණ්ඩික සූත්‍රයේ දැක්වෙන රූපයක් ඇස ගැටීම, චක්ඛු විඤ්ඤාණයන් පහළ වීම, වේදනාවන් ඇති වීම ආදිය මෙන් ම අභිධර්මයේ දැක්වෙන අතීත භවාංගය රූපයන් ඇස ගැටුණ විට චලනය වීම් ආදිය ද පටිච්ච සමුප්පාද න්‍යාය වන එය ඇති විට මෙය ඇත. එය උපදින විට මෙය උපදී යන්න අනුව තේරුම්ගත යුතු ව ඇත.

දැකීම නමැති ක්‍රියාවලියේ දී (අනෙක් එවායේ දී ද එසේ ය) දැකීම සඳහා සිත මුල දී ම සබැඳෙන අතර දැකීම නිසා සිත වෙනස් වේ. පළමු කොටසේ දී විපාක සිතක් ලෙසත්, දෙවනුව කර්ම සිතක් ලෙසත් සහභාගී වේ. මෙහි දී අවධාරණය කළ යුත්තේ සිත කවර ස්වභාවයෙන් වුව සමස්ත ක්‍රියාවලියේ දී ද ක්‍රියාත්මක වන බව ය.

මේ අනුව, සිත සහ ද්‍රව්‍ය (භෞතිකය) පිළිබඳ වන දාර්ශනික කතිකාවතේ දී අපට කිව හැක්කේ අප ගේ එදිනෙදා (ලෞකික) වැඩවල දී සිත සහ ද්‍රව්‍ය යනුවෙන් කොටස් දෙකක් (ද්විත්වයක්) ගැනීම සාධාරණ වුව, සාමාන්‍ය මනස් මගින් ම කෙරෙන්නා වූ අවසාන විග්‍රහයේ දී සහ බෞද්ධ සූත්‍ර (සහ අභිධර්මය) මත පදනම් වූ විට, එවායේ ස්වාධීන (පරමාර්ථ වශයෙන්) පැවැත්මක් පිළිගැනීම කළ නොහැකි බවයි. මෙසේ මේවායේ ස්වාධීන පැවැත්ම ප්‍රතික්ෂේප කළ විගස අප අප ගේ පදනමට වැටේ. බටහිර විවිධ මතවාදවලට සෘජු ප්‍රතිචාර දැක්වීමේ මග එවිට පැහැදිලිව එළි පෙහෙළි වේ.

ද්‍රව්‍ය-මනසහි ස්වාධීන සහ මිශ්‍රිත පැවැත්මයන් අහෝසි කර ගැනීම සඳහා වර්තමාන විද්‍යාත්මක චින්තනයෙන් ඔද්දල් වූ මනස් සහිත පුද්ගලයන්ට ගැලපෙන පරිදි සකස් වූ තර්ක, න්‍යාය පද්ධතියක් නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ ඇත. මෙය අදට අතිශය වැදගත් වන්නේ ඒ නිසා ය.

සිත සහ ද්‍රව්‍යය (භෞතිකය) පිළිබඳව වන මෙම විග්‍රහය අදාළ වන්නේ ධ්‍යාන ආදී කිසිවක් නො ලද සාමාන්‍ය මනස් සහිත පුද්ගලයන් හට පමණක් බව මෙහි දී සැලකිය යුතු ය. බුදුන් වහන්සේ මතු නො ව ධ්‍යානලාභියකු වුව සම්බන්ධයෙන් අපට කිසිවක් ප්‍රකාශ කළ නොහැකි ය. එවැනි උතුමන් පිළිබඳව (එනම් එතුමන් ගේ ලෝක පිළිබඳව) බුදුන් වහන්සේ විවිධ අවස්ථාවල දී යම් යම් දැ දේශනා කොට ඇතත්, එවා අප අප ගේ මනස් මගින් අනවශ්‍ය විග්‍රහයට භාජනය නො කළ යුතු ය. "සියල්ල" මනසට සාපේක්ෂ බැව් පවසන අප, මේ මනස වෙනස් වූ විට "සියල්ල" පෙනෙන ආකාරය දැන් (ඒ වෙනසට පෙර) ප්‍රකාශ කරන්නේ කෙසේ ද?

"Concept and Reality" නැමැති පොතේ දී ඥාණානන්ද හිමියෝ මධුපිණ්ඩික සූත්‍රය ඇසුරෙන් මෙම සිත සහ ද්‍රව්‍ය පිළිබඳව වන කතාව විචක්ෂණ ලෙස විග්‍රහ කරති. අභිධර්මයේ දී මෙම කතාව රූප, චිත්ත. චෛතසික නම්

පරමාර්ථ ධර්ම ඇසුරෙන් විග්‍රහ කෙරේ. එහෙත් මේ එකක් වත් ස්වාධීන පැවැත්මක් නොමැති බැව් අභිධර්මයේ දී කියැවේ. මධුපිණ්ඩික සූත්‍ර පාඨය සහ විඤ්ඤාණ පච්චයා නාම රූපං, නාම රූප පච්චයා විඤ්ඤාණං යනුවෙන් සඳහන් වන අවස්ථාවල දී මේ ස්වාධීන පැවැත්මත් නොමැති ය යන්න සංයුක්තව පුළුල් ව සඳහන් වන අතර, අභිධර්මයේ දී ධර්ම ලෙස සූක්ෂම ව සියල්ල විග්‍රහ කොට අවසානයේ එම විශ්ලේෂිත ධර්මවලට ස්වාධීන පැවැත්මක් නොමැති ය යන්නෙන් කෙළවර වේ. සිත සහ ද්‍රව්‍ය පිළිබඳව වන මෙම විග්‍රහය තවත් මතයක් (කතාවක්) ලෙස නො ව යම් අවස්ථාවක දී යමකු විසින් මේවාට ස්වාධීන පැවැත්මක් ආරෝපණය කිරීමට උත්සාහ ගත හොත් ඊට එරෙහි ව යොදාගත හැකි තර්ක පද්ධතියක් ලෙස පමණක් යොදා ගැනීම වඩාත් සුදුසු ය. යන්න අප ගේ අදහසයි.

නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ අදහස් ඔස්සේ මෙම තත්ත්වය බටහිර විද්‍යාත්මක මතවාදවලින් තොරව මනාව තේරුම් ගත හැකි ය. එලෙස ගත් විට මෙය මතයක් නො වූ මතයකි. නිර්මාණාත්මක සාපේක්ෂතාවාදයේ විශේෂත්වය වන්නේ ද එයයි.

*වරලත් ඉංජිනේරු*
**කපිල පීරිස්**